# ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

## ලංකා ධීවර සංස්ථාව

## පුරප්පාඩු

**ලංකා ධීවර සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සේවා ගණය : කළමනාකරණ සහකාර -තාක්ෂණික නොවන**

**කළමනාකරණ සහකාර (අලෙවි) (MA 1-2)**

**සුදුසුකම්**
**බාහිර අපේක්ෂකයින්**

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ සහ ගණිතයද තවත් විෂය දෙකක් (02) ද, ඇතුළු විෂය හතරකට (04) සම්මාන සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලත්ව විෂය හයකින් (06) එක් වරකදී සමත් වීම.

සහ

02. අධ්‍යාන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් (සාමාන්‍ය දැනුම විෂය හැර) ගණකාධිකරණය ඇතුළු වාණිජ විෂය තුනකින් (03) සමත් වීම.

සටහන : පිළිගත් ආයතනයකින් පරිගණක භාවිතය පිළිබඳව හදාරා තිබෙන බවට සහතිකයක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

**සුදුසුකම් : ප්‍රාථමික- ශිල්පීය නොවන/ ප්‍රාථමික - අර්ධ ශිල්පීය/ප්‍රාථමික - ශිල්පීය යන සේවා ගණවල සේවය කරන සේවක සේවිකාවන්ට පහත දැක්වෙන සුදුසුකම් ලබා තිබේනම් අයදුම් කල හැකි වේ.**

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ සහ ගණිතයද තවත් විෂය දෙකක් (02) ද, ඇතුළු විෂය හතරකට (04) සම්මාන සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලත්ව විෂය හයකින් (06) එක් වරකදී සමත් වීම.

සහ

02. සේවා පලපුරුද්ද : ප්‍රාථමික- ශිල්පීය නොවන/ ප්‍රාථමික - අර්ධ ශිල්පීය/ප්‍රාථමික - ශිල්පීය යන සේවා ගණවල අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා පලපුරුද්දක් හා තනතුරේ ස්ථිර කර තිබෙන සේවකයෙකු/සේවිකාවක වීම.

සටහන : පිළිගත් ආයතනයකින් පරිගණක භාවිතය පිළිබඳව හදාරා තිබෙන බවට සහතිකයක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

වැටුප : **MA 1-2- 2025 Rs. [46220 – 10x540– 7 x630-12 x 1080- 12 x 1280-84350]**
**රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා (ජීවන වියදම් දීමනාව) හිමි වේ.**

**වෙනත් ප්‍රතිලාභ :**

1. සේවක අර්ථ සාධක අරමුදල් වෙනුවෙන් වැටුපෙන් අඩුකර ගන්නා 10% දායක මුදල සඳහා සංස්ථාව මගින් 15% දායක මුදලක් බැර කරනු ලැබේ.
2. සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3%ක ප්‍රදානයන් බැර කරනු ලැබේ.
3. රජයේ චක්‍රලේඛ අනුව ප්‍රවාහන පහසුකම් / හෝ දීමනා.

**පොදු කොන්දේසි**

(අ) අපේක්ෂකයින්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අයවිය යුතු වේ.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.
(ආ)රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.
(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ඈ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු වේ.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත තොරතුරු (CV) හා අදාල අධ්‍යාපන සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ සහතික පත්‍ද සමඟ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව **2026.06.07** දිනට හෝ ඊට ප්‍රථම තනතුරේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (E mail : chairman@cfc.gov.lk )

සභාපති
ලංකා ධීවර සංස්ථාව
නො 15, රොක් හවුස් පටුමග
කොළඹ 15.
දුරකථන අංක (0112-540455)